**මන්මුනෙයි ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 19 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 30 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

සභාවේ සේවකයන් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.507,544 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය
**----------------------**

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය
**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.6,923,090 කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.13,456,670 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය
**-----------------------------**

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
**-----------------------------------**

2015 වර්ෂයේදී රු. 891,194 ක වියදමින් ළමා උද්‍යානයේ සෙල්ලම් කාර් ධාවන පථයක් ඉදිකර ඒ සඳහා රු.126,250 ක වියදමින් සෙල්ලම් කාර් 04 ක් මිලදී ගෙන තිබූ නමුත් මිලදී ගෙන මසක් ඇතුළත ඒවා පළුදු වීම හේතුවෙන් එම කාර් මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණි. එම නිසා මේ සඳහා වැය කළ රු.1,017,444 ක මුදල නිෂ්ඵල වියදමක් බවට පත්ව තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කර තිබූ විගණන ඡේදවලින් අනාවරණය කර තිබූ ඌනතාවයන් හා අඩුපාඩු සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | ඇතුළත් විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2015 | 2.2.2 (ආ) | 1990 වර්ෂයේ විනාශ කරනු ලැබූ වත්කම් ලෙජර් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම. |
| 2015 | 2.2.3 (අ) | විදුලි පාරිභෝගිකයන්ගෙන් අයකර ගතයුතු මුදල් අයකර ගැනීමට වර්ෂ 25 කට අධික කාලයක සිට කටයුතු නොකිරීම. |
| 2015 | 2.2.3 (ආ) | ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු මුදල් ගෙවීම සඳහා වර්ෂ 25 කට අධික කාලයක සිට කටයුතු කර නොතිබීම. |
| 2015 | 2.2.5 (I) | ඇප මුදල් ලබාගත යුතු නිලධාරීන්ගෙන් එම ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. |
| 2015 | 4.1 (ආ) | සභාවට පරිත්‍යාග කරනු ලැබූ වාහන 03 ක අයිතිය මාරුකිරීමට කටයුතු කර නොතිබුණි. |
| 2015 | 4.2 (ආ) | නිෂ්කාර්යව පවතින ශාරීරික අභ්‍යාස උපකරණ භාවිතා කිරීමට කටයුතු කර නොතිබීම. |

## 4.2 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) ගිණුම්කරණය | ලැබිය යුතු හා ගෙවිය යුතු ඒවා ගිණුම්ගත කිරීම. |